# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
### 2026 ජූලි / අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

### ආර්ථිකවිද්‍යාව

### ආර්ථිකවිද්‍යා මූලධර්ම - ECON 18214

කැමති ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) ආර්ථිකවිද්‍යාවේ කාර්යභාරය කුමක් ද යන්න එහි විකාශය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ආර්ථිකවිද්‍යාව තුළ භාවිත කෙරෙන විශ්ලේෂණ විධි මොනවාද? (ලකුණු 10)

02. අ) 'හිඟකම සහ තේරීම' විෂයෙහි කේන්ද්‍රීය ගැටලුව වශයෙන් හඳුන්වන්නේ ඇයි ද යන්න පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 06)

ආ) 'නිෂ්පාදන හැකියා මායිම' පදනම් කරගනිමින් කාර්යක්ෂම තේරීම සහ නිෂ්පාදන කාර්යක්ෂමතාව පෙන්වන්න. (ලකුණු 08)

ඉ) අර්ථක්‍රමයක ප්‍රතිපත්ති සම්පාදනයේ දී ආවස්ථික පිරිවැය සංකල්පය යොදා ගනු ලබන්නේ ඇයි ද යන්න උචිත නිදසුන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. පහත ලේඛනයේ දක්වා ඇත්තේ කල්පිත භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොල තොරතුරු වේ. මිල (P) රුපියල් හා ප්‍රමාණය (Q) කිලෝ ග්‍රෑම් (දහස් ගණනින්)

| P | Qd | Qs |
|---|---|---|
| 100 | 160 | 60 |
| 120 | 140 | 90 |
| 140 | 120 | 110 |
| 160 | 100 | 140 |

ඉහත තොරතුරු භාවිතයෙන්,

අ) i. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 02)

ii. වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

iii. වෙළෙඳපොල සමතුලිතයේ දී මිල ඉල්ලුම් නම්‍යතාව සහ සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

ආ) මෙම භාණ්ඩය සඳහා ඒකකයක් මත රුපියල් 8 ක අලෙවි බද්දක් පනවන්නේ නම් නව වෙළෙඳපොල සමතුලිතය සොයන්න. (ලකුණු 02)

ඉ) i. භාණ්ඩයක් මත ආනයන තීරු බද්දක් පනවන්නේ නම්, වෙළෙඳපොල කෙරෙහි කුමන බලපෑම් ඇති කෙරෙන්නේද? (ලකුණු 02)

ii. භාණ්ඩ මත අය කෙරෙන ආනයන තීරු බද්දක හා අපනයන තීරු බද්දක ආර්ථික ප්‍රතිවිපාක අතර ඇති වෙනස ප්‍රායෝගික නිදසුන් ආශ්‍රයෙන් පහදන්න. (ලකුණු 04)

ඊ) තරඟකාරී වෙළෙඳපොලක සහල් කිලෝ ග්‍රෑමයක් සඳහා සමතුලිත මිල රුපියල් 200 ක් වශයෙන් තීරණය වී ඇති විටෙක, රජය විසින් එම මිලට වඩා ඉහළින් රුපියල් 210 ක් වශයෙන් උපරිම මිලක් පැනවීම තුළින් ඇති කෙරෙන ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. අ) කෙටිකාලීන නිෂ්පාදන අවධි වෙන් කෙරෙන පදනම කුමක්ද? යන්න උචිත රූප සටහනක් ආශ්‍රයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

ආ) නිෂ්පාදකයකුගේ ලාභ උපරිම කෙරෙන නිමැවුම සහ අලෙවි කළ හැකි නිමැවුම අතර වෙනස අයබාර හා පිරිවැය වක්‍ර සටහනක් මගින් පහදන්න. (ලකුණු 06)

ඉ) නිෂ්පාදන න්‍යායේ අයබාර වක්‍ර හා පිරිවැය වක්‍ර අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය කුමක්ද? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. අ) කර්මාන්තය සහ ආයතනය අතර පවත්නා සම්බන්ධය කුමක්ද යන්න පූර්ණ තරඟකාරී වෙළෙඳපොල පදනම් කරගනිමින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

ආ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක් පැවැතීම සඳහා අවැසි කොන්දේසි මොනවාද? (ලකුණු 04)

ඉ) 'පූර්ණ තරඟකාරී ආයතනයක අයබාර වක්‍ර සහ පිරිවැය වක්‍ර පිහිටීම මත එහි ලාභය තීරණය කෙරෙනු ඇත.' මෙම ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 05)

ඊ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක දිගු කාලීන සමතුලිතය තීරණය කෙරෙන ආකාරය උචිත රූප සටහනක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

06. අ) ඒකාධිකාරී වෙළෙඳපොල ඉල්ලුම් වක්‍රය සහ සාමාන්‍ය අයබාර වක්‍රයත්, ආන්තික අයබාර වක්‍රයත් අතර පවතිනුයේ කුමන ආකාර සම්බන්ධයක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) 'ඒකාධිකාරී වෙළෙඳපොල සමතුලිතය යටතේ සෑම විටෙකම නිෂ්පාදකයා අති ප්‍රාමාණික ලාභ ලබනවාය යන්න තහවුරු නොකෙරේ.' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 06)

ඉ) ඒකාධිකාරී වෙළෙඳපොල මාදිලිය යටතේ සමාජ සුබසාධන හානිය යනුවෙන් හඳුන්වනුයේ කුමක්ද? යෝග්‍ය රූප සටහනක් භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 08)

07. අ) කල්පිත ආර්ථිකයක පහත තොරතුරු සපයා ඇත (වටිනාකම රුපියල් දශ ලක්ෂ)

| | අයිතමය | වටිනාකම |
|---|---|---|
| 01 | ප්‍රාථමික අංශය | 2,500 |
| 02 | ද්විතීයික අංශය | 5,500 |
| 03 | තෘතීයික අංශය | 10,500 |
| 04 | නිෂ්පාදනයේ අතරමැදි යෙදවුම් | 950 |
| 05 | පෞද්ගලික පරිභෝජන වියදම් | 13,500 |
| 06 | රජයේ පරිභෝජන වියදම් | 2,500 |
| 07 | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 5,500 |
| 08 | භාණ්ඩ හා සේවා අපනයන | 3,000 |
| 09 | භාණ්ඩ හා සේවා ආනයන | 4,000 |
| 10 | නිෂ්පාදන මත සහනාධාර අඩු කළ බදු | 2,500 |

ඉහත වගුවේ දත්ත භාවිත කරමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

i. මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම (ලකුණු 02)

ii. දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම (ලකුණු 02)

iii. දළ දේශීය ඉතුරුම් ප්‍රමාණයේ වටිනාකම (ලකුණු 02)

ආ) රාජ්‍ය ආර්ථික කටයුතු නොමැති සංවෘත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 2000 + 0.8\,Y$ සහ ආයෝජන (I) 800 වශයෙන් පවතී. (වටිනාකම රුපියල් දශ ලක්ෂ)

i. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02)

ii. ඉතුරුම් මට්ටම ශුන්‍ය වන ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02)

iii. ඉහත i හා ii තොරතුරු රූප සටහනක් මගින් දක්වන්න. (ලකුණු 02)

ඉ) i. රටක ජාතික ගිණුම් ගණනය කිරීමේ දී මුහුණ දෙන ගැටලු මොනවාද? (ලකුණු 04)

ii. රටක ජාතික ගිණුම්කරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

08. අ) මුදලේ අභ්‍යන්තර වටිනාකම නිර්වචනය කර එය ආර්ථිකයේ පොදු මිල මට්ටම සමග පවත්නා සම්බන්ධය විස්තර කරන්න. (ලකුණු 06)

ආ) වාණිජ බැංකු පද්ධතිය තුළ මුදල් මැවීමේ ක්‍රියාවලිය කල්පිත සංඛ්‍යා නිදසුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඉ) මුදල් ප්‍රමාණවාදී විනිමය සමීකරණය ගොඩනැගීමේ දී භාවිතා කෙරෙන උපකල්පන මොනවාද යන්න දක්වා, නූතන ආර්ථිකයන්හි මෙම උපකල්පන කොතෙක් දුරට යථාර්ථවාදී වන්නේ දැයි පිරික්සන්න. (ලකුණු 08)

09. වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අර්බුදයේ ගතිකත්වය පිළිබඳ විවේචනාත්මකව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 20)

10. පහත හතරකට (04) කෙටි සටහන් ලියන්න.

i. අවශ්‍යතා සහ වුවමනා
ii. ශ්‍රම විභජනය සහ ඵලදායීතාව
iii. ආර්ථික නිදහස සහ පාරිභෝගික ස්වාධිපත්‍යය
iv. ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය පාලන උපක්‍රම
v. ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය

(ලකුණු 05 බැගින්)

***********************************